# ව්‍යාපාර කළමනාකරණය
# (Business Management)
# (BMGT)

## ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව

# විෂය නිර්දේශය


දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය



**www.cdce.kln.ac.lk**

**ISBN 978-955-4563-39-1**

දෙවන මුද්‍රණය (සංශෝධිත) 2022

**ප්‍රකාශනය :**

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*
*කැලණිය විශ්වවිද්‍යාලය*
*කැලණිය*

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ මුද්‍රණය කර විකිණීම සපුරා තහනම් වේ.*

# ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා විෂයය ඒකක

**පළමු වසර**

| | |
|---|---|
| BMGT E1015 | කළමනාකරණ මූලධර්ම |
| BMGT E1025 | ව්‍යාපාර ගිණුම්කරණය |
| BMGT E1035 | ව්‍යාපාරික ආර්ථික විද්‍යාව |
| BMGT E1045 | ව්‍යාපාර නීතිය |
| BMGT E1055 | ව්‍යාපාර සඳහා ගණිතය |
| BMGT E1065 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| BMGT E1075 | ව්‍යාපාර සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි (English For Buisness Communication) |

**දෙවන වසර**

| | |
|---|---|
| BMGT E2015 | අලෙවි කළමනාකරණය |
| BMGT E2025 | මානව සම්පත් කළමනාකරණය |
| BMGT E2035 | කළමනාකරුවන් සඳහා ගිණුම්කරණය |
| BMGT E2045 | කළමනාකරණය සඳහා සංඛ්‍යානය |
| BMGT E2055 | ව්‍යාපාරික තොරතුරු පද්ධති |
| BMGT E2065 | සංවිධාන න්‍යාය සහ සැකැස්ම |

**තෙවන වසර**

| | |
|---|---|
| BMGT E3015 | උපායශීලි කළමනාකරණය |
| BMGT E3025 | කුඩා ව්‍යාපාර කළමනාකරණය |
| BMGT E3035 | සමස්ත තත්ත්ව කළමනාකරණය |
| BMGT E3045 | සංකාර්ය කළමනාකරණය |
| BMGT E3055 | සංවිධාන චර්යාව |
| BMGT E3065 | ව්‍යාපාර මූල්‍ය |

**ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය :-**

විෂයක් සඳහා ලබාගත් ලකුණු පහත සඳහන් පරිදි දොළොස් විධි ක්‍රමයකට ශ්‍රේණිගත කරනු ලැබේ.

| ලකුණු පරාසය | ශ්‍රේණිය | ශ්‍රේණි ලකුණු අගය |
|---|---|---|
| 85-100 | A+ | 4.00 |
| 70-84 | A | 4.00 |
| 65-69 | A- | 3.70 |
| 60-64 | B+ | 3.30 |
| 55-59 | B | 3.00 |
| 50-54 | B- | 2.70 |
| 45-49 | C+ | 2.30 |
| 40-44 | C | 2.00 |
| 35-39 | C- | 1.70 |
| 30-34 | D+ | 1.30 |
| 25-29 | D | 1.00 |
| 00-24 | E | 0.00 |

යම් ශිෂ්‍යයෙක් විසින් පාඨමාලාවට අදාළ සියලු ම විෂය ඒකක සම්පූර්ණ කළ යුතු වන අතර, එසේ කිරීමට අපොහොසත් වන විෂය ඒකක සම්බන්ධයෙන් පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් නොකරයි නම් එකී විෂය ඒකක සඳහා E ශ්‍රේණියක් දෙනු ලැබේ.

**ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය ගණනය :-**

ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය යනු අධ්‍යයන සම්භාර අනුව බර තබන ලද ශ්‍රේණිගත ලකුණු අගයේ මධ්‍යයනය වේ.

උදා: අධ්‍යයන සම්භාර අනුව බර තබන ලද ශ්‍රේණිගත ලකුණු අගයන්හි එකතුව මුළු අධ්‍යයන සම්භාර ගණනින් බෙදීමෙන් **ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය (GPA)** නිර්ණය කරනු ලැබේ. දෙවන දශමස්ථානයට ශ්‍රේණිගතත ලකුණු සාමාන්‍යය ගණනය කරනු ලැබේ. උදා: ලෙස ශිෂ්‍යයකු විසින් අධ්‍යයන සම්භාරිත 05 බැගින් වූ විෂය ඒකක 06ක් සඳහා A,C,B+, D, E සහ A+ යන ශ්‍රේණි ලබාගත හොත්, ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය (GPA),

$$\frac{5 \times 4.0 + 5 \times 2.0 + 5 \times 3.3 + 5 \times 1.0 + 5 \times 0.0 + 5 \times 4.0}{5 + 5 + 5 + 5 + 5 + 5}$$

$$= \frac{20.0 + 10.0 + 16.5 + 5.0 + 0.0 + 20.0}{30}$$

$$= \frac{71.5}{30} = 2.38333$$

= 2.38 වේ. උපාධි ප්‍රදානය සඳහා ශ්‍රේණිගත ලකුණු සාමාන්‍ය (GPA) ගණනය කිරීම සඳහා සියලු ම විෂය ඒකක (BMGTE 1075- English for Buisness Communication හැර) සලකා බලනු ලැබේ.

# ප්‍රථම වසර

## BMGT E1015
## කළමනාකරණ මූලධර්ම

### අරමුණ

- කළමනාකරණ මූලධර්ම පිළිබඳ න්‍යායාත්මක දැනුමක් ලබාදීම.
- කළමනාකරණ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ මූලික දක්ෂතා වර්ධනය කරගැනීම.

### ඉගෙනුම් පල

- කළමනාකරණයේ සහ කළමනාකරුවන්ගේ ස්වභාවය විස්තර කිරීම.
- කළමනාකරණය පිළිබඳ සම්භාව්‍ය පිවිසුම, චර්යාත්මක පිවිසුම පද්ධති පිවිසුම සහ ඇගයීම සහ සංක්ෂිප්ත කිරීම.
- සංවිධාන පරිසරයේ ස්වභාවය සහ එහි ප්‍රධාන අංගයන් හඳුනා ගැනීම.
- මූලික කළමනාකරණ කාර්යයන් හතර හඳුනාගැනීම සහ පැහැදිලි කිරීම.

### පාඨමාලා අන්තර්ගතය

**කළමනාකරණය හැඳින්වීම**

විවිධ වූ මට්ටම්වල සහ ක්ෂේත්‍රවල නියුතු විවිධ වර්ගවලට අයත් කළමනාකරුවන්, කළමනාකරුවන්ගේ දක්ෂතා සහ කාර්යභාරය. කළමනාකරණ පිවිසුම්, සම්භාව්‍ය ප්‍රවේශය, චර්යාත්මක ප්‍රවේශය, පද්ධති ප්‍රවේශය. කළමනාකරණ සන්දර්භය, සංවිධානයක සාමාන්‍ය, කාර්ය

සාධක සහ අභ්‍යන්තර පරිසරය, පරිසරය සංවිධානවලට බලපාන ආකාරය. සංවිධාන ඒවායේ පරිසරයට අනුගත විය යුතු අන්දම. සිව් වැදෑරුම් මූලික කළමනාකරණ කාර්යයන්. සැලසුම්කරණය, සැලසුම්කරණ ක්‍රියාවලිය, සංවිධාන අරමුණු, සැලසුම් වර්ග, තීරණ ගැනීම පිළිබඳ තාර්කික ප්‍රවේශය. සංවිධානකරණයෙහි මූලිකාංග. ඒකියා නිර්මාණය කිරීම, ඒකියා කාණ්ඩගත කිරීම, වාර්තාකරණ සම්බන්ධතා ස්ථාපිත කිරීම, ඒකියාවන් අතර අධිකාරි බලය බෙදා හැරීම (ඒකියාවලට අධිකාරී බලය පැවරීම) ඒකියා අතර සම්බන්ධීකරණ කටයුතු(සමායෝජනය), තනතුරු වෙනස් කොට දැක්වීම, සංවිධාන නිර්මාණය කිරීම සහ නිර්මාණය කිරීමට යොදා ගත හැකි මූලික ආකෘති බලපෑම. (Influencing). අභිප්‍රේරණය, අභිප්‍රේරණ න්‍යායන්. සන්නිවේදනය. අන්තර්පුද්ගල සන්නිවේදනය, සංවිධාන සන්නිවේදනය. නායකත්වයේ ස්වභාවය., නායකත්වය හා කළමනාකරණ බලය, නායකත්ව චර්යාව, මිචිගන් සහ ඔහියෝ අධ්‍යයනයන්, කළමනාකරණ ජාලකය (Grid). පාලනය, පාලන ක්‍රියාවලියෙහි පියවර, පාලන ක්‍රම, ප්‍රාථමික පාලනය, ඉවත් කිරීමේ පාලනය (Screening Control), නිමැවුම් ක්‍රියාවලිය අවසානයේ දී නිමැවුමු පාලනය කිරීම, (Post - action Control). මූල්‍ය පාලනය, අය වැය පාලනය, නිල තන්ත්‍ර පාලනය, විමධ්‍යගත පාලනය.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**


1. Certo Samuel C, and Certo Strevis. 92007). *Modern Management*. New Delhi: Prantic Hall of India.
2. Daft Richard L. 92007). *The New Era of Management*. India: Rahul Print Opack, Delhi.
3. Giffin, Ricky, W. (2000). *Management* (5th ed). Miffilin company, Houghton.
4. Robbins, Stephen. P. (2006). *Management.* New Delhi: Prantic Hall of India.
5. Stoner, J.A.F. Freeman, K.E. Giber, D.R. (1996). *Management*. New Delhi: prentice hall Inc.

# BMGT E1025
## ව්‍යාපාර ගිණුම්කරණය

**අරමුණ**

ව්‍යාපාර ගිණුමට අදාළ සංකල්ප සහ ක්‍රමවේදයන් පිළිබඳ දැනුම ලබාදීම, මූල්‍යමය තොරතුරු භාවිතයෙන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හා ව්‍යාපාර සම්බන්ධ තීරණ ගැනීමට

**ඉගෙනුම් පල**

- ගිණුම්කරණ මූලධර්ම, ගිණුම්කරණ ප්‍රමිත හඳුනාගැනීමට හා විස්තර කිරීමට හැකිවීම.
- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
- ව්‍යාපාර ගිණුම්කරණ තොරතුරු කළමනාකරණ තීරණ ගැනීමේ දී භාවිත කිරීම.

**පාඨමාලා අන්තර්ගතය**

මූල්‍ය ගිණුම්කරණයේ ස්වභාවය හා විෂයය පථය, ගිණුම්කරණ මූලධර්ම, ගිණුම්කරණ සංකල්ප, ගිණුම්කරණ ක්‍රම සහ ගිණුම් ප්‍රතිපත්ති, ගිණුම්කරණ ප්‍රමිතීන්, නිෂ්පාදන ගිණුම්, තනි පුද්ගල ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශන, හවුල් ව්‍යාපාර ගිණුම්කරණය - කීර්ති නාමය හා වත්කම් ප්‍රත්‍යාගණනය, මූල්‍ය ප්‍රකාශන හවුල් ව්‍යාපාර විසුරුවා හැරීම, ශාඛා සීමිත සමාගම් සඳහා ගිණුම්කරණ- කොටස් සහ ණයකර නිකුතුව, වරණීය කොටස් හා ණයකර නිදහස් කිරීම, ගිණුම්කරණ අනුපාත.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය හා පැවරුම්

**නිර්දේශිත කියවීම්**


1. Jayasekara, V. and lalitha, R. (2011). *Finacial Accounting.* India: Dorling Kindersley. New Delhi.
2. wood F. & Sangster, A. (2008). *Business Accounting I* (11th Edi).New Delhi: Pitman Publishing.
3. Insititute of Charted Accountants of Sri Lanka. (2002). Sri Lanka Accounting Standards, Colombo.

# BMGT E1035
# ව්‍යාපාරික ආර්ථික විද්‍යාව

## අරමුණ
මිනිස් හැසිරීමට අදාළ ආර්ථික න්‍යායන්, සංකල්ප හා ආර්ථික සම්බන්ධතාවලට අදාළ දැනුම ලබාදීම, පුද්ගල ව්‍යාපාර හා සමාජ මට්ටමින් මුහුණ දෙන ආර්ථික ප්‍රශ්නවලට විසඳුම් සෙවීම සඳහා අවශ්‍ය කරන විශ්ලේෂණය හා ආර්ථික තීරණ ගැනීමට අදාළ වන කුසලතා දියුණු කිරීම

## ඉගෙනුම් පල
- ආර්ථික සංකල්පයන් මනාව විස්තර කිරීම ආර්ථික විශ්ලේෂණාත්මක උපකරණයන් හඳුනා ගැනීම.
- තනි පුද්ගල ආයතන සහ සමාජය විසින් ගනු ලබන ආර්ථික තීරණයන්හි තාර්කිකභාවය ඇගයීම.
- වර්තමානයේ පවතින ප්‍රායෝගික ආර්ථික ගැටලු විශ්ලේෂණය කර විවරණය කර කළමනාකරණ තීරණ ගැනීම.

## පාඨමාලා අන්තර්ගතය
**ආර්ථික විද්‍යාව හැඳින්වීම-** නිර්වචන, ආර්ථික විද්‍යාවේ මූලික සංකල්පයන්, මූලික ආර්ථික ප්‍රශ්න, නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය, ඉල්ලුම සැපයුම හා නම්‍යතාවන් - ඉල්ලුම, සැපයුම, මිල තීරණය කිරීම, ඉල්ලුම් සහ සැපයුම් නම්‍යතාවන්, වෙළඳපොළ සඳහා රාජ්‍ය මැදිහත් වීම, පාරිභෝගික ඉල්ලුම් න්‍යාය- ආන්තික උපයෝගීතා ප්‍රවේශය, උපේක්ෂා වක්‍ර ප්‍රවේශය, ප්‍රත්‍යක්ෂ වරණය, නිෂ්පාදන සහ පිරිවැය න්‍යායන්- නිෂ්පාදන ශ්‍රිතය, පිරිවැය සංකල්පයන්, කෙටි කාලීන සහ දිගු කාලීන පිරිවැය, ආදායමේ හැසිරීම. වෙළඳපොළ ව්‍යුහයන්- හැඳින්වීම, පූර්ණ තරගය පූර්ණ තරගයේ මූලිකාංග, සමතුලිත මිල සහ ප්‍රමාණය, ඒකාධිකාරය ඒකාධිකාරී වෙළඳපළ තුළ ලාභ උපරිම කරගැනීම, අපූර්ණ තරගය ඒකාධිකාරී තරඟය, කතිපයාධිකාරය, නිල නායක්ත ආකෘතිය, කාටලය, ව්‍යවර්තිත ඉල්ලුම් වක්‍රය, ජාතික ආදායම- මූලික සංකල්ප,

ජාතික ආදායමේ වෘත්තාකාර ප්‍රවාහය, ජාතික ආදායමේ මිනුම් ක්‍රම නිමවුම් ක්‍රමය, ආදායම් ක්‍රමය සහ වියදම් ක්‍රමය, ජාතික ආදායම තීරණය වීම පිළිබඳ කේන්සියානු න්‍යාය, විවිධ ආර්ථිකයන්ට අදාළව පරිභෝජනය (C), ඉතුරුම් (S), ආයෝජනය (I), භාණ්ඩ සහ මුදල් වෙළඳපොළ (IS - LM ආකෘතිය) - භාණ්ඩ වෙළඳපොළ හා I S වක්‍රය, මුදල් වෙළඳපොල සහ LM වක්‍රය, භාණ්ඩ සහ මුදල් වෙළඳපළ සමතුලිතය. I S, LM සමතුලිතය වෙනස් වීම. සමාහාර ඉල්ලුම සහ සමාහාර සැපයුම- සමාහාර ඉල්ලුම, සමාහාර සැපයුම, ආර්ථිකයේ සමතුලිතය සහ සමතුලිතය වෙනස් වීම, මූල්‍ය සහ පිස්කල් ප්‍රතිපත්තීන්- පිස්කල් ප්‍රතිපත්ති, පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියා කරන්නේ කෙසේද? මූල්‍යප්‍රතිපත්ති- මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියා කරන්නේ කෙසේද? තෙරපුම් ප්‍රතිවිපාකය, උද්ධමනය සහ සේවා වියුක්තිය - උද්ධමනය නිර්වචන, හේතුන් සහ පාලනය කිරීම, උද්ධමනය සහ සේවා වියුක්තිය අතර වාසි හුවමාරුව, සේවා වියුක්තිය නිර්වචන, සේවා වියුක්ති ප්‍රභේදයන්, පූර්ණ සේවා නියුක්තිය, විවෘත ආර්ථික සාර්ව ප්‍රතිපත්තීන් - ගෙවුම් ශේෂය සහ විනිමය අනුපාතිකයන්, පූර්ණ ප්‍රාග්ධන සංචලතාව. ව්‍යාපාරික ආර්ථික විද්‍යාවේ සහ විශ්ලේෂනාත්මක උපකරණ හඳුනා ගැනීම

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**

1. Lipsy, R.G. Chrystal, K.A. (1999). *An Introduction to Economics* (9th Ed).UK: Oxford University press.
2. Ahuja, H.L. (2000). *Business Economics Micro* (Reprint) (2nd Ed.).New Delhi: S. Chand and Co.Ltd.
3. Leroy, M.R. (2009). *Economics Today The Micro View*. 13th Edi. Boton: Addition Wesley.
4. Misra S.K. and Puri V.K. (1999). *Buisness economics*. New Delhi: Himalaya Publishing house.

# BMGT E1045
## ව්‍යාපාර නීතිය සහ කාර්මික නීතිය

**අරමුණ**

ව්‍යාපාර සන්දර්භය සම්බන්ධ නීති පිළිබඳ ඉගෙනුම් ලබාදීම හා ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතුවල පවතින ප්‍රායෝගික නීතිමය ගැටලු විසඳීමට අවශ්‍ය කුසලතා වැඩි දියුණු කිරීම.

**ඉගෙනුම් පල**

- ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ නීතියේ භූමිකාව කුමක් ද යි හඳුනාගැනීම සහ විස්තර කිරීම
- උගත් නීති හා විධි විධාන ඇසුරින් ප්‍රායෝගික ගැටලු නිරාකරණය කිරීම

**පාඨමාලා අන්තර්ගතය :-**

**හැඳින්වීම** - නීතිය පිළිබඳ නිර්වචනය, නීතියේ පරමාර්ථ, නීති වර්ගීකරණය, ශ්‍රී ලංකාවේ නීති පද්ධති (ඉංග්‍රීසි නීතිය, රෝම ලන්දේසි නීතිය, උඩරට නීතිය, තේසවලාමෙයි නීතිය, මුස්ලිම් නීතිය) ශ්‍රී ලංකාවේ නීති මූලාශ්‍රය, අධිකරණ පද්ධතිය, මානව අයිතිවාසිකම්, ව්‍යාපාර නීතියේ භූමිකාව හා වැදගත්භාවය, ගිවිසුම් නීතිය - ගිවිසුම්වල ස්වභාවය සහ වර්ග, නීතියෙන් බැඳීමේ චේතනාව, අර්පණය සහ ප්‍රතිග්‍රහණය, අගනා ප්‍රතිෂ්ඨාව, ගිවිසුම් ශක්‍යතාව, ගිවිසුමේ නියම (අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත). ගිවිසුම්වල දෝෂ (වැරදීම, අවනිදේශනය, බලහත්කාරය, අයුතු බලපෑම). නීති විරෝධි ගිවිසුම්, ගිවිසුම් අවසන් වීම, ගිවිසුම් කඩ කිරීම සඳහා ප්‍රතිකර්ම, නියෝජ්‍යත්ව නීතිය - නියෝජ්‍යත්ව ඇති වන ආකාරය, නියෝජිතයෙකු සතු අයිතිවාසිකම් සහ යුතුකම්, නියෝජිතයාගේ බලය, ප්‍රධානියාගේ පැවැත්ම හෙළි කිරීම සහ හෙළි නොකිරීම, නියෝජ්‍යත්වය අවසානයට පත්වීම, භාණ්ඩ විකිණීමේ නීතිය

- භාණ්ඩ විකිණීමේ ගිවිසුමක මූලිකාංග, කොන්දේසි සහ ප්‍රතිඥාභාර, භාණ්ඩවල අයිතිය මාරු වීම, භාණ්ඩ විකිණීමේ ගිවිසුම ක්‍රියාත්මක වීම, මිල නොලත් විකුණුම්කරුගේ අයිතිවාසිකම්, භාණ්ඩ විකිණීමේ ගිවිසුම් කඩ කිරීමේ ප්‍රතිකර්ම, ගනුදෙනු කළ හැකි ලියවිලිවලට අදාළ නීතිය - ගනුදෙනු කළ හැකි ලියවිලිවල ස්වභාවය, පොරොන්දු පත්‍ර, විනිමය බිල්පත් සහ චෙක් පත්, ගනුදෙනු කළ හැකි ලියවිල්ලක පාර්ශ්වයන්, දරන්නා සහ යථාකාල ධාරකයා, ගනුදෙනු කළ හැකි ලියවිලි ඉදිරිපත් කිරීම, ගනුදෙනු කළ හැකි ලියවිලි අගරු වීම, චෙක්පත් රේඛනය, බැංකුකරු සහ ගනුදෙනුකරුවා. සමාගම් නීතිය - සමාගම්වල ස්වභාවය, සංස්ථාපනය, සාංගමික සංස්ථා පත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය, කොටස් සහ ණය ප්‍රාග්ධනය, සාමාජිකත්වය හා සුළු කොටස් හිමියන්ගේ ආරක්ෂාව, රැස්වීම්, අධ්‍යක්ෂවරු සහ ලේකම්වරු, සමාගමක් විසුරුවා හැරීම, හවුල් ව්‍යාපාර නීතිය - හවුල් ව්‍යාපාර ඇතිවන ආකාරය, හවුල්කරුවන්ගේ බලය, හවුල්කරුවන්ගේ වගකීම්, හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් හා යුතුකම්, හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීම. රක්ෂණ නීතිය - රක්ෂණ ගිවිසුමක මූලිකාංග, රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම, ශ්‍රී ලංකාවේ කාර්මික සම්බන්ධතාවල ඉතිහාසය, රැකියා ගිවිසුම්, රැකියාවේ ස්වභාවය, කාර්මික ආරවුල් පනත, සාප්පු හා කාර්යාල සේවක පනත, පාරිතෝෂික ගෙවීමේ පනත, පඩි පාලක සභා ආඥා පනත, වෘත්තීය සමිති ක්‍රියා මාර්ග පනත, සේවා නියුක්තිකයන්ගේ සේවය අවසන් කිරීමේ පනත, මාතෘ ප්‍රතිලාභ ආඥා පනත, කර්මාන්තශාලා ආඥා පනත, කාන්තාවන්, තරුණ අය සහ ළමුන් රැකියාවේ යෙදීමේ පනත, සේවක පන්ති ආඥා පනත

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**


1. Adams, Alex. (2000). *Law for Business Students*. London: Pitman publishing.
2. Kuchal, M.C. (2001). *Business Law* (2nd Ed). Delhi: Vikas Publishing Houce.
3. Bollie, J. gordon. (2001). *Elements of Mercantile Law*. London: butter Worth & Company.
4. Gamage Prasadini (2010). *Buisness law*. Author publication.
5. Gamage Prasadini (2013). *Industrial Law. Colombo: S.Godage & Brothers.*

# BMGT E1055
## ව්‍යාපාර සඳහා ගණිතය

**අරමුණ**

විද්‍යාර්ථීන්ගේ මූලික ගණිතමය දැනුම දියුණු කිරීම හා ගණිතමය ශිල්ප ක්‍රම භාවිතයට අදාළ වන විශ්ලේෂණ හා තීරණ ගැනීමේ කුසලතා වර්ධනය කිරීම

**ඉගෙනුම් පල**

- කළමනාකරණ තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන විවිධ වූ ගණිතමය ක්‍රම හඳුනා ගැනීම.
- ගණිතමය ශිල්ප ක්‍රම භාවිතයෙන් කළමනාකරණ ගැටලු විස්තර කිරීම.
- ඥානාන්විත ව කළමනාකරණ ගැටලු විශ්ලේෂණය හා විවරණය කිරීම.
- සුදුසු ගණිතමය ක්‍රම භාවිත කර ව්‍යාපාර ගැටලු විසඳීම.

**පාඨමාලා අන්තර්ගතය**

**සංඛ්‍යා පද්ධති**-තාත්ත්වික සංඛ්‍යා රේඛාව, ස්වභාවික සංඛ්‍යා, ඉරට්ටේ සංඛ්‍යා, ඔත්තේ සංඛ්‍යා, ප්‍රථමක සංඛ්‍යා, පරිමේය සංඛ්‍යා, අපරිමේය සංඛ්‍යා, තාත්ත්වික සංඛ්‍යා, වීජ ගණිතය - සාධක, කුඩා පොදු සාධකය, මහා පොදු සාධකය, දර්ශක, ලඝුගණක, වීජ ගණිත ප්‍රකාශන විසඳීම, සමීකරණ, සරල සමීකරණ, සමගාමී සමීකරණ, වර්ගජ සමීකරණ, සමීකරණ ආශ්‍රිත ගැටලු, ශ්‍රේණි - සමාන්තර ශ්‍රේණි, ගුණෝත්තර ශ්‍රේණි. මූල්‍ය ගණිතය-සුළු පොලිය, වැල් පොලිය, වට්ටම, ක්ෂය වීම, වර්තමාන අගය, වාර්ෂිකයන්, විශ්ලේෂ ජ්‍යාමිතිය ලක්ෂ්‍ය අතර දුර, සරල රේඛාවක

සමීකරණ, වක්‍ර ප්‍රස්තාර, වෘත්තය, පරාවලය, ඉල්ලුම්, සැපයුම් හා ආදායම් ශ්‍රිත, විවික්ත ගණිතය- කුලක, සංකරණ, සංයෝජන සහ ද්විපද ප්‍රමේයය, කලනය - සීමා, වක්‍රයක බෑවුම, වෙනස්වීමේ ශීඝ්‍රතාව, අවකලනය, ආන්තික පිරිවැය, ආන්තික ආදායම, ආන්තික ලාභය, අනුකලනය, වක්‍රයකින් වටවන වර්ගඵලය, **න්‍යාස**-සරල න්‍යාස, න්‍යාස ආශ්‍රිත, ගණිතමය ගැටලු, න්‍යාස වර්ග

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**

1. Bharadwaj, R. (2010). *Mathematics for Managers*. New Delhi: University Science press.
2. Johnsonbaugh, R. (2009). *Discrete mathmatics*. 6th ed. New York: Pearson Education Asia Ltd.
3. Slater, J. (2011). *Practical buisness Math Procedures*. 10th edi. New York: McGraw Hill.
4. Waner, S. Costenoble, S. R. (2011). *Finite Mathmatics and Applied Calculus.* Canada: Nelson education Ltd.

# BMGT E1065
## තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය

### අරමුණ

- සංවිධානවල භාවිත වන පරිගණක පද්ධතීන් පිළිබඳ දැනුම සහ අවබෝධය ලබාදීම.
- ව්‍යාපාර අරමුණුවලට ළඟා වීමට තොරතුරු තාක්ෂණය මෙවලමක් ලෙස යොදා ගැනීමට අදාළ වන දැනුම ලබාදීම.

### ඉගෙනුම් ඵල

- පරිගණක පිළිබඳ මූලික සංකල්ප හඳුනා ගැනීම සහ අවබෝධ කරගැනීම.
- තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීම.
- තොරතුරු පද්ධතීන්ට සම්බන්ධිත ගැටලු විශ්ලේෂණය කිරීම
- තථ්‍ය ව්‍යාපාර ලෝකයේ සිද්ධීන් සඳහා විසඳුම් යෝජනා කිරීම ශිෂ්‍යයාට හැකි විය යුතු ය.

### පාඨමාලා අන්තර්ගතය

පරිගණක අධ්‍යයනය හැඳින්වීම. පරිගණක භාවිතයන්. කෘත්‍රිම ආකෘතීන් සහ අතාත්ත්වික යථානුරූපකරණය. අන්තර්ජාලය. ආරක්ෂාව සහ සමාජයට පරිගණකයෙන් වන බලපෑම. ගැලීම් සටහන්, පරිගණක භාෂා සහ ව්‍යාජ කේත. තාර්කීය ප්‍රවේශයන්. මෘදුකාංග. දත්ත පද්ධති. දෘඩාංග. මෙහෙයුම් පද්ධති. අනාගත සංවර්ධනයන්.

### ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

විභාග ඇගයීම

**නිර්දේශිත කියවීම්**


1. James, A. O'brien, George marakas, ramesh Behl(2009). *Management information Systems. 9th Ed; New york: Mc Grow Hill.*
2. Kenneth C. Laudon, Jane P. Laudon. (2010). *Management information Systems: Managing the digital Firm.* 10th Ed. New York: Prentic Hall.
3. Rainer, R.K. (2006). *Introduction to information Systems.: Supporting and Transforming Buisness* (1st Ed). New York: Wiley and Sons Inc.

# BMGT E1075
## English for Business Communication

**Aim**

To develop knowledge in English language for excellent written and spoken command and communication.

**Learning Outcomes**

- develop the ability for increased command of English language especially in business communication.
- demonstrate competence in reading reference material.
- develop the ability to listen and comprehend the spoken word.
- learn how the language knowledge can be freely and confidently utilized in every social situation and business/ official matters.
- learn language skills necessary to attend to the business/ official correspondence.
- demonstrate ability of writing essay type answers to, questions on Commerce and Management.

**Course Content**

Grammar; Tenses, Parts of speech & word formation, Sentence structures, Direct & indirect speech, Phrases, Idioms & proverbs. Summary; Summarizing speeches, Articles, Letters, Paragraphs, Reports. Letter Writing; Personal & informal, Formal & official, Social, Memorandums. Report Writing; Reporting incidents, Meetings, Presentation of performances of various functions-i.e.-production, Functions within factories & work sites, Feasibility reports, Sales

reports. Comprehension; Articles from News papers & Magazines, Reports Advertisements & Notices, Dialogues, Prose Passages. Essay; Expression of views on important issues, Topics of current interest.

**Scheme of Evaluation**

Examination, Assignments.

**Method of Teaching and Learning**

Lectures, Seminars

**Recommended Readings**

1. Chapman, L.R.H (1993). *English Grammar and Exercises*. Longman.
2. Raymond, Murphy. (2000).*Essential English Grammar.* Cambridge University Press.
3. Wren and Martin. (1996). *High School English Grammar and Compassion.* S.Chand and Co. Ltd.

# දෙවන වසර

## BMGT E2015
## අලෙවි කළමනාකරණය

**අරමුණ** :-

සාර්ථක අලෙවි උපායන සඳහා පූර්ණ කැපවීම ලබාගැනීමට අලෙවි කළමනාකරණ සම්බන්ධ විද්‍යාර්ථීන්ගේ දැනුම, කුසලතා, ආකල්ප දියුණු කිරීම.

**ඉගෙනුම් ඵල**

- අලෙවිකරණ අභිමුඛ වූ ව්‍යාපාර ක්‍රමවේදයන්ගේ වැදගත්කම හඳුනා ගැනීම.
- අලෙවිකරණ මිශ්‍රණය තුළ ඇති විවිධ උපාය මාර්ග විස්තර කිරීම.
- විවිධ අවස්ථාවන්ට ගැළපෙන අලෙවිකරණ මිශ්‍රණය සහ(සමස්ත) අලෙවිකරණ උපාය මාර්ගය යෝජනා කිරීම.

**පාඨමාලා අන්තර්ගතය**

අලෙවිකරණය හැඳින්වීම-අලෙවිකරණයේ විෂයය පථය, අලෙවිකරණයේ ආරම්භය සහ වර්ධනය, ප්‍රධාන අලෙවිකරණ සංකල්ප, අලෙවිකරණ අවස්ථා විශ්ලේෂණය-උපායශීලී සැලසුම්කරණය (ආයතන සහ උප ඒකක උපායශීලී සැලසුම්කරණය, උපායශීලී අලෙවිකරණ විශ්ලේෂණය, අලෙවිකරණ උපායමාර්ග නිර්මාණය කිරීම) අලෙවිකරණ තොරතුරු පද්ධතිය (අලෙවිකරණ පරිසරය-සාර්ව හා සූක්ෂ්ම පරිසරයන්හි ප්‍රවණතාවන්) පාරිභෝගික වෙළඳපොළ හා ගැනුම්කරු චර්යාව පිළිබඳ ව අවබෝධ කරගැනීම, පාරිභෝගික චර්යාව පිළිබඳ ආකෘතිය, පාරිභෝගික චර්යාවට බලපාන සාධක, ගැනුම්කරු තීරණ ක්‍රියාවලිය,

ව්‍යාපාරික වෙළඳපොළ සහ ව්‍යාපාරික මිල දී ගැනීමේ චර්යාව අවබෝධ කර ගැනීම සංවිධාන විසින් මිල දී ගැනීමේ ස්වභාවය, මිල දී ගැනීමේ තීරණ කෙරෙහි බලපාන ප්‍රධාන බලවේග, මිල දී ගැනීමේ ක්‍රියාවලියේ අදියර, වෙළඳපොළ ඛණ්ඩනය සහ ඉලක්ක වෙළඳපොළ තෝරා ගැනීම වෙළඳපොළ ඛණ්ඩන මට්ටම, පාරිභෝගික සහ ව්‍යාපාරික වෙළඳපොළ ඛණ්ඩනයේ පදනම්, වෙළඳපොළ ඉලක්කකරණය, වෙළඳපොළ ඛණ්ඩ විශ්ලේෂණය සහ තෝරා ගැනීම, පිහිටිකරණ මිශ්‍රණ නිෂ්පාදිත උපක්‍රමය නිෂ්පාදිත මට්ටම්, නිෂ්පාදිත වර්ගීකරණය, නිෂ්පාදිත දිගු තීරණ, සන්නම් තීරණ, ඇසුරුම්කරණය සහ ලේබල්කරණය, නව නිෂ්පාදිත සංවර්ධනය, නිෂ්පාදිත ජීවන චක්‍රය, බෙදාහැරීමේ උපක්‍රමය බෙදාහැරීමේ මාර්ගවල කාර්යභාර්ය, බෙදාහැරීමේ මාර්ග නිර්මාණය සහ කළමනාකරණ තීරණ, සිල්ලර සහ තොග වෙළඳාම් ක්‍රම, සිල්ලර සහ තොග වෙළඳාමට අදාළ අලෙවිකරණ තීරණ, සිල්ලර සහ තොග වෙළඳාමේ ප්‍රවණතා, භෞතිකමය බෙදාහැරීම, මිලනය උපක්‍රම මිලනය අරමුණු තෝරා ගැනීමට ඉල්ලුම් තීරණය කිරීම, පිරිවැය ඇස්තමේන්තු කිරීම, තරගකරුවන්ගේ පිරිවැය, මිල අදායම් පිළිබඳ විශ්ලේෂණය, මිලනය ක්‍රමයක් තෝරා ගැනීම, අවසන් මිල තෝරා ගැනීම, සන්නිවේදන උපක්‍රමය සන්නිවේදන ක්‍රියාවලිය, ඵලදායී සන්නිවේදන ක්‍රමයක් වර්ධනය කිරීමේ පියවර, ප්‍රවර්ධනාත්මක මෙවලම් අලෙවිකරණ සන්නිවේදනය සඳහා අදාළ වන සාධක, සමස්ත අලෙවිකරණ ප්‍රයත්නය කළමනාකරණය කිරීම-අලෙවිකරණ සංවිධානය, අලෙවිකරණ ක්‍රියාත්මක කිරීම, විශ්ලේෂණය සහ පාලනය

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් සහ වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**


1. J. Paul peter, James H. Donnelly, 92006). *A Preface To Marketing Management.* Donnelly. McGraw. Hill Collage.
2. Kotler, P. Keller, K. (2011). *Marketing Management.* (14th ed.) Pretice Hall.
3. Kotler, P. Keller, K. (2011). *Marketing Management.* (11th ed.) Pretice Hall

# BMGT E2025
## මානව සම්පත් කළමනාකරණය

**අරමුණ**

- මානව සම්පත් කළමනාකරණයේ ස්වභාවය, විෂයපථය, වැදගත්කම සහ අන්තර්ගතය පිළිබඳ මූලික දැනුමක් ලබාදීම
- මානව සම්පත් කළමනාකරණ පාඨමාලාව හා මානව සම්පත් වෘත්තියේ විශේෂඥතාව සඳහා අවශ්‍ය වන විද්‍යාර්ථීන්ගේ කුසලතා සහ ආකල්ප වර්ධනය

**ඉගෙනුම් පල**

- මානව සම්පත් කළමනාකරණ ශ්‍රිතයන් හඳුනාගැනීම සහ විස්තර කිරීම
- මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයෙහි අර්බුද පැහැදිලි කිරීම සහ ඇගයීම
- මානව සම්පත් කළමනාකරණයට අදාළ අර්බුද විසඳීම සඳහා විසඳුම් යෝජනා කිරීම

**පාඨමාලා අන්තර්ගතය**

හැඳින්වීම- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විවිධ නිර්වචන, එහි ස්වභාවය, එහි ඇති වැදගත්කම, මානව සම්පත් කළමනාකරණ චින්තනයේ වර්ධනය, මානව සම්පත් කළමනාකරණය සහ පිරිස් කළමනාකරණය, විවිධ ප්‍රවේශයන්, Traditional model, Hardward model, Michigan model, 5P model. රැකියා විශ්ලේෂණය, ආකර්ෂණය හා බඳවා ගැනීම. කාර්ය සාධනය ඇගයීම. පුහුණුව හා සංවර්ධනය.

වැටුප් සහ වේතන පරිපාලනය, රැකියා ආරක්ෂණය හා සෞඛ්‍යය. දුක් ගැනවිලි විසඳීම, විනය පාලනය, කාර්මික සබඳතා, අනාගත අභියෝග, සිද්ධි අධ්‍යයන

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම් :-**


1. Amstrong,M. (2003). *Human Resource Management* (9th Edition).Prentice Hall, New Delhi.
2. Gupta, C. (2006). *Human Resource Management.* New delhi: Sultan Chand & Sons.
3. Opatha, H.H.d.N.P. (2009). *Human Resourse management.* Colombo: Author Publication.
4. Pilbeam, S. Corbridge, M. (2006). *People Resourcing: Contemoporaray HRM in Practice.* 93rd Ed.) London: Prentice hall.
5. Stewart, G.L. Brown, K.G. (2011). *Human Resourse management. Linking Strategy to Practice. (2nd Ed.). New York: Wiley.*

# BMGT E2035
## කළමනාකරුවන් සඳහා ගිණුම්කරණය

### අරමුණ

විවිධ කළමනාකරණ ගිණුම්කරණ ශිල්පක්‍රම පිළිබඳ දැනුමක් ලබාදීම හා ඒවා කෙටි කාලීන හා දිගු කාලීන ව්‍යාපාරික තීරණ ගැනීමට අදාළ වන ආකාරය පිළිබඳ දැනුම ලබාදීම.

### ඉගෙනුම් පල

- කළමනාකරණ ගිණුම්කරණයෙහි මූලික සංකල්පයන් සහ නියමයන් හඳුනා ගැනීම සහ විස්තර කිරීම
- විෂය ඒකකයෙන් ලබා ගත් සංකල්පනාත්මක සහ විශ්ලේෂණාත්මක දැනුම සැලසුම්කරණය, පාලනය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාළ කරගැනීම.

### පාඨමාලා අන්තර්ගතය

කළමනාකරණ ගිණුම්කරණය හා එහි වැදගත්කම. මූල්‍ය ගිණුම්කරණය හා ගිණුම්කරණය අතර වෙනස. පිරිවැය විශ්ලේෂණය. අමුද්‍රව්‍ය පිරි වැය සහ පාලනය. ශ්‍රම පිරිවැය හා අර්ථලාභය පොදු කාර්ය පිරිවැය. ආන්තික පිරිවැය., ලාභ පරිමා විශ්ලේෂණය, සමච්ඡේද ලක්ෂ්‍ය විග්‍රහය හා තීරණ ගැනීම. ප්‍රමිති පිරිවැය., විචල්‍ය විශ්ලේෂණය. අය වැය සහ අය වැය පාලනය. කාරක ප්‍රාග්ධන කළමනාකරණය. අනුපාත විශ්ලේෂණය සහ අනුපාත විශ්ලේෂණයේ වැදගත්කම. ආයෝජන ඇගයීම,. ප්‍රාග්ධන ආයෝජනයේ ලක්ෂණ, ආයෝජන ඇගයීමේ ක්‍රමවේදයන්.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

නිබන්ධන සහ සහ වර්ෂ අවසාන පරීක්ෂණය. පැවරුම් වාර්තා ඉදිරිපත් කිරීම සහ කෙටි පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**


1. Drury, C. (1996). *Management and Cost Accounting.* 6th Ed. London: Interntional Thomson Business Press.
2. Mykhan and Jain P.K. (2008). *Management Accounctin: Text, Problems and Cases,* New Delli:Tata mc Graw Hill Publishing Company ltd.
3. Saxena, V.K. and Vashist C.D. (2009). *Cost and Management Accounting* (3rd Ed;). New Delhi: Sultan and Sons.

# BMGT E2045
## කළමනාකරණය සඳහා සංඛ්‍යානය

**අරමුණ**

- ප්‍රයෝගික ව්‍යාපාර ගැටලු විසඳීම සඳහා සංඛ්‍යාන සංකල්ප හා ක්‍රමවේදයන් හඳුන්වා දීම
- ව්‍යාපාර කළමනාකරණයෙහි සංඛ්‍යාන දැනුම වැඩි කිරීම හා ප්‍රායෝගික ව්‍යාපාර ගැටලු විසඳීම සඳහා සංඛ්‍යාන ශිල්ප ක්‍රමයක් භාවිතයට අවශ්‍ය විශ්ලේෂණ කුසලතා සහ ශක්තීන් දියුණු කිරීම

**ඉගෙනුම් පල**

- දත්ත විශ්ලේෂණය සඳහා පවතින සංඛ්‍යානමය ශිල්පක්‍රම හඳුනා ගැනීම
- අවිනිශ්චිත අවස්ථා යටතේ ව්‍යාපාර තීරණ ගැනීම විස්තර කිරීම
- ව්‍යාපාර කළමනාකරණයට අදාළ වන දත්ත විශ්ලේෂණය කිරීම සහ අර්ථකථනය කිරීමේ දක්ෂතා පෙන්නුම් කිරීම

**පාඨමාලා අන්තර්ගතය**

සංඛ්‍යානයෙහි ස්වභාවය සහ විෂයය පථය, සංඛ්‍යානය හා ව්‍යාපාරික තීරණ, සංඛ්‍යානමය දත්ත, සංඛ්‍යානමය දත්ත වර්ග, දත්ත රැස්කිරීම- දත්ත මූලාශ්‍රය, දත්ත රැස්කිරීමේ ක්‍රම, නියැදි සමීක්ෂණය, ප්‍රශ්නාවලි නිර්මාණය, දත්ත සංවිධානය කිරීම මාධ්‍යයක් ලෙස වගු දත්ත ප්‍රස්තාර ඇසුරින් ඉදිරිපත් කිරීම, ජාල රේඛීය සම්මුච්ත සංඛ්‍යාත වක්‍ර. දත්ත විශ්ලේෂණය, කේන්ද්‍රික ප්‍රණතාවෙහි මිනුම් (මාතය, මධ්‍යස්ථය, මධ්‍යයනය) ස්ථානීය මිනුම්, පරාසය, තුර්ථක අපගමනය, මධ්‍යයන අපගමනය, විචල්‍යතාව සහ සම්මත අපගමනය, සංයුක්ත විචල්‍යතාව,

විවිධ මිනුම් සැසඳීම. ලෝරන්ස් වක්‍රය, කුටිකතාව හා චක්‍රීමය. මූලික සම්භාවිතාව. සම්භාවිතාව නිර්වචනය, නියැදි අවකාශය හා සිද්ධීන්, සම්භාවිතාවෙහි මූලික නීතින්, සංකරණ හා සංයෝජන, බේයස්ගේ ප්‍රමේයය, සසම්භාවී විචල්‍යයන් හා සම්භාවිතා ව්‍යාප්තීන්., සසම්භාවී විචල්‍යයන්, විවික්ත සම්භාවිතා ව්‍යාප්තීන් (ඒකීයපද, ද්විපද, අධි ජ්‍යාමිතික, පොයිසෝන්, ව්‍යාප්තීන්) සන්තතික සම්භාවිතා ව්‍යාප්තීන්) (ඒකීය ප්‍රමත ව්‍යාප්තීන්). නියැදීම සහ නියැදුම් ව්‍යාප්තීන්, හැඳින්වීම, නියැදි මධ්‍යයන්ගේ අන්තර්ගතයෙහි නියැදුම් ව්‍යාප්තිය. නියැදි සමානුපාතිකයන්ගේ නියැදුම් ව්‍යාප්තිය, නියැදි සමානුපාතිතයන්ගේ අන්තරයෙහි නියැදුම් ව්‍යාප්තිය. මූලික සංඛ්‍යාන අනුමිතිය. අනුමිතිය කල්පිත පරීක්ෂාව, විසම්බ පරීක්ෂාව, කයි වර්ග පරීක්ෂාව. සහ සම්බන්ධතා විශ්ලේෂණය, විසිරි තිත් සටහන, සහ සම්බන්ධතා සංගුණකය, සහසම්භාවිතාවෙහි වෙසෙසියාව, තරා සහ සම්බන්ධතා සංගුණකය. ප්‍රතිපායන විශ්ලේෂණය,. සරල රේඛීය ප්‍රතිපායන, අඩුතම වර්ගක්‍රමය,. සම්මත දෝෂය, නිර්ණය සංගුණකය, කාල ශ්‍රේණි විශ්ලේෂණ, කාල ශ්‍රේණියක සංරචක, උපනති, විශ්ලේෂණ, චක්‍රීය විචලනය, ඍතුමය විචලනය, අවිධිමත් විචලනය, දර්ශකාංක, දර්ශකාංක භාවිතයේ දී ඉටු විය යුතු මූලික අවශ්‍යතා, දර්ශකාංක ගොඩ නැඟීම. දර්ශාකාංක භාවිතයෙහි පැන නඟින ගැටලු

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

## නිර්දේශිත කියවීම්


1. Anderson, D.A. Sweeney, D.J. Williams, T.A. (2011). *Statistics for business and Economics.*(11th Ed.). Boston: South western College pub.
2. Bowerman, B.C. O' Connel, R. Murphee, E. S. Orris, J.B. (2012). *Essentials of Buisness Statistics.* New York: Mc Graw Hill.
3. Kzmier, L.J. (2009). *Business Statistics.* (4th Ed.). New York: Mc Graw Hill.
4. Lind, D.A. (2011). *Statistical techniques in Buisness New Economics.* (15th Ed.). New York: Mc Graw Hill.
5. Weieri, R.M. (2010). *Introduction to Buisness Statistics.*(7th Ed.). Cengage Learning. Toebben Drive.

# BMGT E2055
# ව්‍යාපාරික තොරතුරු පද්ධති

**අරමුණ**

- වත්මන් ආයතනවල තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ විවිධ අවධීන් පිළිබඳ දැනුම ලබාදීම
- කළමනාකරණ තීරණ ගැනීමේ දී විවිධ පද්ධතීන් ඒ හා සම්බන්ධ වන ආකාරය පිළිබඳ විද්‍යාර්ථීන්ට ද අවබෝධය ලබාදීම

**ඉගෙනුම් පල :-**

ව්‍යාපාරික ගැටලු හඳුනාගැනීම, ඊට සුදුසු තොරතුරු පද්ධති මත පදනම් වූ විසඳුම් යෝජනා කිරීම හා ක්‍රියාත්මක කිරීම

**පාඨමාලා අන්තර්ගතය :-**

වර්තමාන ගෝලීය ව්‍යාපාර සන්දර්භය තුළ තොරතුරු පද්ධති, වර්තමාන ව්‍යාපාර සන්දර්භය තුළ තොරතුරු පද්ධතිවල කාර්යභාරය, තොරතුරු පද්ධති පිළිබඳ දෘෂ්ටි කෝණ, තොරතුරු පද්ධති පිළිබඳ සමකාලීන ප්‍රවේශයන්, ව්‍යාපාර කාර්යාවලීන් සහ තොරතුරු පද්ධති. ව්‍යාපාර කාර්යාවලීන් තොරතුරු තාක්ෂණය සහ තොරතුරු පද්ධති ව්‍යාපාර කාර්යාවලීන් වැඩි දියුණු කරන ආකාරය, තොරතුරු පද්ධති වර්ග, කණ්ඩායම් කාර්ය සහ සහකරණය සඳහා තොරතුරු පද්ධති ව්‍යාපාරය තුළ තොරතුරු පද්ධති ශ්‍රිතය. ආයතනික යෙදවුම්, ආයතනික පද්ධති, සැපයුම් දාම කළමනාකරණ පද්ධති, පාරිභෝගික සබඳතා කළමනාකරණ පද්ධති. තොරතුරු පද්ධති, සංවිධාන සහ උපාය මාර්ග තොරතුරු පද්ධති ව්‍යාපාර ආයතනවලට බලපාන ආකාරය, තරඟකාරිත්ව වාසිය ළඟා කරගැනීම සඳහා තොරතුරු පද්ධති භාවිත කිරීම, ගෝලීය විද්‍යුද් ව්‍යාපාර සහ සහකරණය විද්‍යුද් වාණිජ්‍යය සහ අන්තර්ජාලය, විද්‍යුද්

වෙළෙඳපොල. තොරතුරු පද්ධති ආශ්‍රිත සදාචාරාත්මක සහ සමාජ ගැටලු තොරතුරු පද්ධති ආශ්‍රිත සමාජ සහ සදාචාරාත්මක ගැටලු අවබෝධ කරගැනීම, තොරතුරු සමාජයක ආචාර ධර්ම තොරතුරු සඳහා අයිතිවාසිකම්, දේපොළ සඳහා අයිතිවාසිකම්. වගවීම හා වගකීම් සහ පද්ධති තත්ත්වය, ජීවන තත්ත්වය. තොරතුරු පද්ධතිය ආරක්ෂා කරගැනීම, පද්ධති අනතුරට භාජනය විය හැකි ආකාරය සහ අයථා භාවිතයෙන් තොරතුරු පද්ධතිය ආරක්ෂා කිරීම සහ පාලනය කිරීමේ ව්‍යාපාරික වටිනාකම, තොරතුරු පද්ධතිවල ආරක්ෂාව සහ පාලනය කිරීම සඳහා රාමුවක් ස්ථාපිත කිරීම, තොරතුරු සම්පත්වල ආරක්ෂාව සඳහා තාක්ෂණයන් සහ මෙවලම්. දැනුම කළමනාකරණය, ආයතනික දැනුම කළමනාකරණ පද්ධති සහ දැනුම් වැඩ පද්ධති.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**

1. Laudon, K.C. & Laudon, J.P. (2012). *Management information Systems- managing the Digital Firm.* 912th ed;); India: Prentice Hall. New Delhi.
2. O'Brien, J.A. & Marakas, G. (2005). *Management Information Systems.* 7th Edi: Mc Graw Hill publications.
3. Turban, E. Leidner, D. Mclean. E. & Wetherbe, j. (2008). *Information Technology for Management- Transforming Organizations in the Digital Economy, india:* John Wiley & Sons.

# BMGT E2065
## සංවිධාන න්‍යාය සහ සැකැස්ම

### අරමුණ

- ව්‍යාපාර අවශ්‍යතාවන්ට ගැළපෙන වාතාවරණය හා සංවිධාන ව්‍යුහයන් නිර්මාණය කිරීම හා දියුණු කිරීමට අදාළ වන අත්‍යවශ්‍ය දැනුම සම්පාදනය
- විවිධ වර්ගයේ සංවිධානවලට ගැළපෙන ආකෘතීන් තේරීමට අදාළ දැනුම සහ කුසලතා ලබා දීම වේ.

### ඉගෙනුම් පල

- සංඝටක හා සංවිධානවල ක්‍රියාවලීන් හඳුනාගැනීම හා තේරුම් ගැනීම
- සංවිධානයන්හි විවිධ වූ කණ්ඩායම් හා ආකෘතීන් හඳුනාගැනීම
- විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් සංවිධාන විශ්ලේෂණය කිරීම හා සංවිධාන තුළ පවතින ගැටලු හඳුනා ගැනීම
- වඩා හොඳ ප්‍රතිඵල සඳහා සංවිධාන මූලිකාංග සඳහා අවශ්‍ය වූ ගැළපුම් යෝජනා කිරීම

### පාඨමාලා අන්තර්ගතය

සංවිධාන හැඳින්වීම, සංවිධානවල වැදගත්කම, සංවිධාන සැකැස්මේ නිර්ණායක, උපාය. සංවිධාන සැකැස්ම සහ ඵලදායීතාව, උපාය මාර්ගික භූමිකාව, සංවිධාන සැකැස්ම සඳහා බලපාන අවස්ථානුකූල සාධක සහ ප්‍රවේශ. සංවිධාන ව්‍යුහයේ මූලිකාංග. ව්‍යුහය පිළිබඳ මූලධර්ම ව්‍යුහය මත තොරතුරු සැකසුම් ප්‍රවේශය, ශ්‍රිතීක ව්‍යුහය, ආංශික ව්‍යුහය, භූගෝලීය ව්‍යුහය, තිරස් ව්‍යුහය, න්‍යාය ව්‍යුහය, ආකෘතික ව්‍යුහය, බාහිර පරිසරය, කාර්ය පරිසරය, සාමාන්‍ය පරිසරය, පාරිසරික

අවිනිශ්චිතතාව, සම්පත් මත රඳා පැවැත්ම, අන්තර් සංවිධාන සම්බන්ධතා, සංවිධාන හරිත පද්ධතිය, ජනගහන පරිසර විද්‍යාව, සහයෝගිතා ජාලය, ආයතනිකත්වය, අන්තර්ජාතික පරිසරය උදෙසා සංවිධාන සැකසීම. අන්තර්ජාතික විකාශයේ අදියර, ගෝලීය උපායන්ට ගැළපෙන ව්‍යුහ සැකසීම, ගෝලීය ශක්‍යතා ගොඩනැංවීම, නිෂ්පාදන සහ සේවා තාක්ෂණය, නිෂ්පාදන පද්ධතිය මත පදනම් වූ woodward ගේ වර්ගීකරණය, පරිගණක ආශ්‍රිත නිෂ්පාදනය, ප්‍රධාන නොවන දෙපාර්තමේන්තු තාක්ෂණය, අන්තර් රැඳියාව පිළිබඳ Thompson ගේ වර්ගීකරණය. සංවිධාන සංස්කෘතිය හා ආචාරධර්ම, කළමනාකරණ ආචාරධර්මවලට බලපාන සාධක, ආචාරධර්ම පිළිබඳ ගැටලු, නව සොයා ගැනීම් සහ වෙනස, විශාල සංවිධාන වෙනස්කම් ඇති කිරීමට බලපාන සාධක, වෙනස්කම් වර්ග හතර, සාර්ථක වෙනසක උපාංග, දෙයාකාරයට ම ක්‍රියා කළ හැකි නිර්මාණය සංවිධනානය කිරීම, නව නිෂ්පාදන ඇති කිරීමේ තිරස් ආකෘතිය, වෙනස ඇති කිරීමට කැප වීමේ අදියර, වෙනස්කම්වල පවතින බාධක. ගැටුම්, බලය හා දේශපාලනය, අන්තර් කණ්ඩායම් ගැටුම්, ගැටුම්වල මූලාශ්‍රය, පුද්ගල එරෙහිව සංවිධාන බලය, බලය එරෙහිව අධිකාරිත්වය, බලය පිළිබඳ සිරස් මූලාශ්‍රය, බලය පිළිබඳ තිරස් මූලාශ්‍රය, දෙපාර්තමේන්තු අතර, පවතින තිරස් බලය කෙරෙහි බලපාන උපායශීලී අවස්ථානුකූල සාධක, සංවිධානවල බලය සහ දේශපාලනික උපාය ක්‍රම, ගනුදෙනු කිරීමේ උපායන්. සංවිධාන ප්‍රමාණය, ජීවන චක්‍රය හා බැස්ම, ජීවන චක්‍ර න්‍යාය, නිලතන්ත්‍රවාදය, සංවිධාන පිරිහීම.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**


1. Daft, R.L. (2010). *Organization Theory and Design.* (10th Ed.). South Western Cengage Learning Publishing Co, Mason.
2. Stephen, R.P. Judge, T.A. (2011). *Organizational Behaviour*. 915th Ed.). New York: Prentice Hall.

# තෙවන වසර

## BMGT E3015
## උපායශීලි කළමනාකරණය

**අරමුණ**

- සංකීර්ණ විස්තීරණ සිද්ධීන්හි ගැටලු හඳුනාගැනීම සඳහා අවශ්‍ය විශ්ලේෂණ රාමු නිර්මාණය සහ ඒවා සඳහා විකල්ප මාර්ග යෝජනා කිරීම සහ අනාගත ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ නියම කිරීම.
- ව්‍යාපාර සම්බන්ධයෙන් පෙර ඉගෙන ගන්නා ලද දැනුම අනුකලනය කිරීම සඳහා සිසුන්ගේ මනෝභාවාත්මක හැකියාවන් දියුණු කිරීම.
- ව්‍යාපාරයක් ක්‍රියාත්මක වන වර්තමාන සහ අනාගත පරිසරයන් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ඇති කිරීම.
- න්‍යාය සහ පරිචය අතර ඇති පරතරය පිරවීම සඳහා කලින් ඉගෙන ගන්නා ලද සංකල්ප සහ ශිල්පීය ක්‍රම අදාළ කරගන්නේ කෙසේ ද සහ කවදා ද යන්න පිළිබඳ අවබෝධයක් ඇති කිරීම
- සංකීර්ණ සංකල්පිත ගැටලු සඳහා අවශ්‍ය විශ්ලේෂණ සහ තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කිරීම.

**ඉගෙනුම් පල**

- ඉතා තරඟකාරී සහ වෙනස් වන පරිසරයක් තුළ උපාය මාර්ග සකස් කිරීමේ සංකීර්ණත්වය හඳුනා ගැනීම
- සමස්ත කර්මාන්තය සහ සංවිධානයෙහි කාර්ය ඵල කෙරෙහි බලපෑම් කළ හැකි ප්‍රධාන පරිසර සාධක හඳුනා ගැනීම සහ ඕනෑ ම සංවිධානයක පරිසර විශ්ලේෂණය කිරීම.
- උපායශීලිව කළමනාකරණය කරගත හැකි අවස්ථා හඳුනා ගැනීම.

- අත්කර ගන්නා ලද දැනුම භාවිතයෙන්, ව්‍යාපාර සැලසුම්, උපාය මාර්ග සහ සංයුක්ත ව්‍යාපාර සැලසුම් පිළියෙල කිරීම.

**පාඨමාලා අන්තර්ගතය**

හැඳින්වීමඃ උපායමාර්ග හඳුන්වාදීම. උපාය මාර්ගික තත්ත්වය. උපාය මාර්ගික සාමාර්ථ්‍යය, අපේක්ෂාවන් සහ අරමුණු. උපායමාර්ග තෝරා ගැනීම, ව්‍යාපාර මට්ටමේ උපායමාර්ග, අධිසංකීර්ණ තත්ත්වයක් යටතේ තරගකාරී උපායමාර්ග, සමස්ත සහ අන්තර්ජාතික මට්ටමේ උපාය මාර්ග. උපායමාර්ග සංවිධානයේ ක්‍රම සහ නිර්දේශයන්. උපායමාර්ග ක්‍රියාවට නැංවීම. සාර්ථකත්වය සඳහා සංවිධානය වීම. සාර්ථකත්වය සඳහා උර දීම, උපායමාර්ග වෙනස්කම් කළමනාකරණය, උපායමාර්ග පුනරීක්ෂණය, ඇගයීම් සහ පාලනය. උපායශීලි කළමනාකරණයෙහි අභියෝග සහ උපනතීන්.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**

1. Fred, R. David. 92013). *Strategic Management: Concepts and Cases.* 14th ed:; Prentice Hall PTR.
2. Johnson, G. Scholes, K. & Whittington, R. (2009). *Exploring Corporate Strategy,* England: pearson Education Ltd.
3. Thompson, A. Strickland, A.J. Gamble, J.E. & Jain, A.K. (2010). *Crafting and Executing strategy. New Delhi:* Tata McGraw Hill.

# BMGT E3025
## කුඩා ව්‍යාපාර කළමනාකරණය

### අරමුණ

- කුඩා ව්‍යාපාර කළමනාකරණය හා සම්බන්ධ මූලික සංකල්ප හා උපකරණ පිළිබඳ අවබෝධය ලබාදීම සහ සංවර්ධනය
- ආර්ථිකය තුළ කුඩා ව්‍යාපාරයන්හි කාර්යභාරය පැහැදිලි කිරීම

### ඉගෙනුම් පල

- කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ මූලික ක්ෂේත්‍රයන්හි දැනුම හා අවබෝධය
- ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ කුඩා ව්‍යාපාර කළමනාකරණයේ කාර්යභාරය
- කුඩා ව්‍යාපාර පිළිබඳ දැනුම ප්‍රායෝගිකත්වය තුළ භාවිතය

### පාඨමාලා අන්තර්ගතය

කුඩා ව්‍යාපාර හැඳින්වීම - කුඩා ව්‍යාපාරවල ඓතිහාසික වටිනාකම කුඩා ව්‍යාපාර නිර්වචන, විශ්ව ආර්ථිකය තුළ කුඩා ව්‍යාපාර, කුඩා ව්‍යාපාර සහ ශ්‍රී ලාංකික ආර්ථිකය, අයිතියේ ස්වභාවය - නීතිමය ස්වරූපය, නීති උපදෙස් මූලාශ්‍රය, නීතිමය අයිතිවාසිකම් (පේටන්ට්, ප්‍රකාශන අයිතිය හා වෙළෙඳ ලකුණු ආදිය), ව්‍යවසායකත්වය හැඳින්වීම - ව්‍යවසායකත්ව නිර්වචනය, ව්‍යවසායකත්වයේ ලක්ෂණ - ව්‍යවසායකයන්ගේ සංවර්ධනය, ව්‍යාපාර ව්‍යාපෘතියක් තෝරා ගැනීම, ව්‍යාපාර සැලසුම - ව්‍යාපාර සැලසුම්වල වැදගත්කම, නිෂ්ඨාව, අරමුණු, පරමාර්ථ පිහිටුවීම, තත්ත්ව විගණනය වර්තමාන තත්ත්වය, අලෙවිකරණය, මූල්‍යකරණය, ගිණුම්කරණය, නිෂ්පාදනය, මානව සම්බන්ධතා, මිලට ගැනීම සහ තොග කළමනාකරණය, බදුකරණය, කුඩා ව්‍යාපාරවල කළමනාකරණ ශ්‍රිති.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**

1. David, H.H. (2005). *Entrepreneurship New Venture Creation* (1st Edi). Prentice Hall, New delhi.
2. Colombo Plan Staff Collage for Technician education Manila, (1999). *Entrepreneurship Development.* India: Tata McGraw Hill Publishing Co.
3. Hisrich, r. Perers, M. and Shepherd, D. (2006). *Entrepreneurship. 6th Edi; Mc Graw Hill.*
4. Dollinger, M.J. (2003). *Entrepreneurship. Stategies and Resources.* New Delhi: Pearson Education.

# BMGT E3035
## සමස්ත තත්ත්ව කළමනාකරණය

### අරමුණ

නිෂ්පාදන සහ සේවා අංශයන්හි ඵලදායී භාවිතය සඳහා අවශ්‍ය සමස්ත තත්ත්ව කළමනාකරණ ප්‍රතිපත්ති, රාමු, මෙවලම් හා ශිල්පක්‍රම පිළිබඳ විද්‍යාර්ථීන් දැනුම්වත් කිරීම.

### ඉගෙනුම් පල

- තත්ත්වය හා තත්ත්ව කළමනාකරණයේ ස්වභාවය සහ එහි වැගදත්කම පිළිබඳ හඳුනා ගැනීම.
- තත්ත්ව විප්ලවයෙහි ඓතිහාසික සංවර්ධන පිළිබඳ දැක්ම විස්තර කිරීම
- තත්ත්ව කළමනාකරණ න්‍යාය හා පරිචය විස්තර කිරීම
- සංවිධානවල තත්ත්ව කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ ඇගයීම්

### පාඨමාලා අන්තර්ගතය

හැඳින්වීම- තත්ත්වය නිර්වචනය, සමස්ත තත්ත්ව කළමනාකරණය නිර්වචනය, මූලික තත්ත්ව සංකල්ප, තත්ත්ව කළමනාකරණයේ විකාශය, සමස්ත තත්ත්ව කළමනාකරණයේ මූලික න්‍යායාචාර්යවරුන්, සමස්ත තත්ත්ව කළමනාකරණ ක්‍රියාවලිය, අවශ්‍යතාවන් හා බාධාවන්, තත්ත්ව පිරිවැය, ඵලදායීතාව ළඟා කරගැනීම සඳහා කළමනාකරණය කිරීම, වරණීයකරණය, ප්‍රමිතිකරණය, මූලික ජපාන තත්ත්ව සංකල්ප (5S, JIT, කයිසෙන්, 6 සිග්මා). සංඛ්‍යානමය තත්ත්ව පාලනය, සමස්ත තත්ත්ව කළමනාකරණය සඳහා නායකත්වය, ජාතික තත්ත්ව ප්‍රතිපත්තිය. ජාතික තත්ත්ව සම්මාන වැඩසටහන, මැල්කම් බැල්ඩ්‍රිජ් තත්ත්ව සම්මානය

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**


1. De Alwis A.C. *Samastha Tathwa Kalamanakaranaya.* (1 part). (2008). Colombo: Godage International Publishing.
2. J.Juran., *Jurans Qulity hand Book (*5th Ed;). (1999). Mc Graw Hill publishing Company. Burr ridge Parkway Burr Ridge.
3. Joel E. Ross, Susan Perry, *Total Qulity Management: Text, Cases, and Readings.* (2008). CRC Press, ISBN: 157444266X
4. L. Suganthi Anand A. Samuel, Total Qulity Management. (2004). PHI Learning Pvt Ltd: East Delhi: Delhi: India.
5. Poornima M. Charanathmath, *Total Qulity Management.* (2009). India: Dorling Kindersley (India) Pvt Ltd.
6. S.L.Lucy. *Principales of Total Qulity,* (3rd Ed). (2004). Press. UK Vincent K. Omachonu, Joel E. ross.

# BMGT E3045
## සංකාර්ය කළමනාකරණය

**අරමුණ :-**

- විද්‍යාර්ථීන්ට, සංකාර්ය කළමනාකරණයේ සංකල්ප සහ ශ්‍රිතයන් පිළිබඳ හඳුන්වාදීම
- සංකාර්ය කළමනාකරණයේ ශ්‍රිතයන් සහ ක්‍රියාවලිය පිළිබඳ දැනුමක් ලබාදීම

**ඉගෙනුම් පල :-**

- සංකාර්ය කළමනාකරණයේ සංකල්ප සහ ශ්‍රිතයන් හඳුන්වාදීම
- කළමනාකරුවන්ට සංවිධානවල තීරණ ගැනීම සඳහා, පවතින ප්‍රායෝගික ගැටලු විසඳීම, ඒවායේ ප්‍රතිඵල අර්ථකථනය කිරීම.

**පාඨමාලා අන්තර්ගතය :-**

හැඳින්වීම - සංකාර්ය කළමනාකරණයෙහි ඓතිහාසික පරිණාමය, වර්තමානයේ සංකාර්ය කළමනාකරණය කෙරෙහි බලපාන සාධක, සංකාර්ය කළමනාකරණය අධ්‍යයනයේ විවිධ ප්‍රවේශ, නිෂ්පාදනය පද්ධතියක් ලෙස, නිෂ්පාදනය සංවිධාන ශ්‍රිතයක් ලෙස, සංකාර්ය කළමනාකරණය තුළ තීරණ ගැනීම, සංකාර්ය සැලසුම්කරණය - සංකාර්ය කළමනාකරණයට අදාළ පුරෝකථන, පුරෝකථන මාදිලි, කෙටි කාලීන හා දිගු කාලීන පුරෝකථන, පරිගණක මෘදුකාංග ආධාරයෙන් පුරෝකථනය කිරීම, කුඩා ව්‍යාපාරයන්හි පුරෝකථනය කිරීම, නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රියාවලීන්හි මාදිලි නිර්මාණ හා සංවර්ධනය කිරීම - නව නිෂ්පාදිත සංවර්ධනය කිරීම, පවත්නා නිෂ්පාදනයන්හි මාදිලි/නිර්මාණ වැඩි දියුණු කිරීම, ක්‍රියාවලි සැලසුම්කරණය සහ නිර්මාණය, අනුගමනය කළ යුතු තාක්ෂණය තෝරා ගැනීම සහ කළමනාකරණය, උපායශීලි විකල්ප අතර සම්පත් බෙදා හැරීම, (ඒකජ ප්‍රක්‍රමණ), උපලේඛනගත කිරීම, ධාරිතා සැලසුම්කරණය - ධාරිතාව මැනීම, ධාරිතා ඉල්ලුම

පුරෝකථනය කිරීම, පරිමානුකූල පිරිමැසුම, පහසුකම් ස්ථානගත කිරීම - ස්ථානගත කිරීමේ තීරණ කෙරෙහි බලපාන සාධක, පහසුකම් වර්ග හා ස්ථානගත කිරීමෙහිලා බලපාන ප්‍රධාන සාධක, ස්ථානගත කිරීමේ තීරණ සඳහා ගුණාත්මක සහ ප්‍රමාණාත්මක සාධක සමෝධානය කිරීම, පහසුකම් බිම් සැලැස්ම/පිරියත - නිෂ්පාදන පහසුකම් බිම් සැලැස්ම/පිරියත, සේවා පහසුකම් බිම් සැලැස්ම/ පිරියත, මෙහෙයුම් තීරණ - ඉල්ලුම සපුරාලීම සඳහා නිෂ්පාදනය සැලසුම් කිරීම - නිෂ්පාදන සැලසුම් පද්ධතිය, ස්වායත්ත ඉල්ලුම් තොග පද්ධතිය, ද්‍රව්‍ය අවශ්‍යතා සැලසුම්කරණය, නිසි කලට නිෂ්පාදනය (Just-In-Time) ද්‍රව්‍ය කළමනාකරණය හා මිලදී ගැනීම, ඵලදායීතාව, ගුණත්වය සහ විශ්වසනීයත්වය සඳහා මෙහෙයුම් කාර්යයන් - ඵලදායීතාව හා මානවචර්යාව, රැකියා නිර්මාණය - වැඩ අධ්‍යයනය හා වැඩ මැනීම, ඉගෙනුම් චක්‍රය, සේවක සෞඛ්‍ය සහ ආරක්ෂාව, තත්ත්ව පාලනය, ව්‍යාපෘති සැලසුම්කරණය හා පාලනය, නඩත්තු කළමනාකරණය.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**


1. Buffa & Miller J.(1985). *Production & Inventory Systems, Planning & Control.* USA : Richard D Irvin, Inc.
2. Chary S.N. (2007). *Production and Operations management* (8$^{th}$ edition). Delhi: Tata Mc Graw-Hill.
3. Evarett, E. A. Ronald J . E. (2002) . *Production & Operations Management*, New Jersey: Prentice Hall Inc., Ennglewood Cliffs.
4. Mahadevan, B. (2008). *Operations management Theory and Practice,* (4$^{th}$ edition), Dorling Kindersley, Del

# BMGT E3055
## සංවිධාන චර්යාව

### අරමුණ

සංවිධාන පසුතලය තුළ පුද්ගල හැසිරීම බලපාන සංවිධාන චර්යාවෙහි ගැටලු හා මූලික අදහස් පිළබඳ විද්‍යාර්ථීන් දැනුවත් කිරීම, රක්ෂාව යෙදී සිටින පරිසරය තුළ ඇති චර්යා ගැටලු විශ්ලේෂණය අවශ්‍ය නිපුණතා දියුණු කිරීම, පුද්ගල චර්යාවේ වෙනස්කම් වටහා දීම, කණ්ඩායම් තුළ එම හැසිරීමේ වෙනස් වන ආකාරය හා සංවිධාන පද්ධතිය චර්යාවට එය, බලපාන්නේ කෙසේ ද පිළිබඳ සිසුන් දැනුම්වත් කිරීම වේ.

### ඉගෙනුම් පල

- සංවිධාන චර්යා විෂයය පථය සහ එහි ස්වභාවය පිළිබඳ දැනුම සහ අවබෝධය
- සංවිධාන චර්යාව පිළිබඳ වැඩෙන අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳ දැක්මක් ඇති කර ගැනීම
- පුද්ගලයන් හා කණ්ඩායම්වල හැසිරීම් හා සම්බන්ධ කරුණු පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීම.
- සංවිධානවල මිනිසුන්ගේ චර්යාව පාලනය කිරීම හා පුරෝකථනය කිරීම සඳහා ක්‍රමවේදයන් සැකසීමටත් හැකි විය යුතු ය.

### පාඨමාලා අන්තර්ගතය

හැඳින්වීම-නිර්වචනයන්, සංවිධාන චර්යා විෂය ක්ෂේත්‍රයට, දායක ක්ෂේත්‍රයන්, සංවිධාන චර්යා ආරක්ෂක (anchors) සංවිධාන චර්යාවේ අවස්ථා හා අභියෝග. පුද්ගල චර්යාව, හැකියාව, අගය කිරීම, ආකල්ප, ඉගෙනුම, පෞරුෂත්වය, සංජානනය. කණ්ඩායම් චර්යාව, කණ්ඩායම් හැසිරීමේ පදනම, වැඩ කන්ඩායම්, සන්නිවේදනය, නායකත්වය, බලය

හා සංවිධානික දේශපාලනය, ගැටුම් හා සාකච්ඡා කිරීම්. සංවිධානමය සාධක, සංවිධාන සංස්කෘතිය, සංවිධාන වෙනස්වීම් හා සංවර්ධනය සහ සංවර්ධන ව්‍යූහය.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**


1. Luthans, f. 92006). *Organizational Behaviour*. New York, USA: MC Graw Hill.
2. McShane, S. (2012). *Organizational Behaviour.* New York, USA: MC Graw Hill.
3. Robbins, s.P.& Judge, T.A. (2010). *Organizational Behaviour*. New Delhi: prentice Hall.

# BMGT E3065
## ව්‍යාපාර මූල්‍ය

### අරමුණ

සංවිධානවල ආයෝජනය සහ මූල්‍ය තීරණ ගැනීමේ දී අත්‍යවශ්‍ය වන මූලික මූල්‍ය කළමනකාරණ සංකල්ප පිළිබඳ දැනුම ලබාදීම

### ඉගෙනුම් පල

- මූල්‍ය කළමනාකරණයේ සංකල්ප හඳුනා ගැනීමට හා විස්තර කිරීම
- සංවිධානවල මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය විශ්ලේෂණය කිරීම.
- කළමනාකරණ තීරණ ගැනීමේ දී මූල්‍ය තොරතුරු යොදා ගැනීම.

### පාඨමාලා අන්තර්ගතය

මූල්‍ය කළමනාකරණය හැඳින්වීම, මූල්‍ය කළමනාකරණයේ කාර්යයන්, මූල්‍ය කළමනාකරණයේ අරමුණු, නියෝජ්‍යත්ව සම්බන්ධතා. මුදලේ කාල වටිනාකම. මුදල් ප්‍රවාහයන්වල වර්තමාන අගය සහ අනාගත අගය. මූල්‍ය ප්‍රභයන්. විවිධ මූල්‍ය ප්‍රභවයන්. මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය, අනුපාත විශ්ලේෂණය, ප්‍රවණතා විශ්ලේෂණය, අන්තර් - ආයතන විශ්ලේෂණය. ප්‍රාග්ධන පිරිවැය, ස්කන්ධ ප්‍රාග්ධනය, වරණීය කොටස් ප්‍රාග්ධනය හා ණය ප්‍රාග්ධනයේ පිරිවැය, බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධනයේ පිරිවැය (WACC). ආයෝජන ඇගයීම, ආයෝජන තීරණවල ස්වභාවය, විවිධ ආයෝජන ඇගයුම් ශිල්ප ක්‍රම. අවධානම හා ප්‍රතිලාභ. ආයෝජන ප්‍රතිලාභ, ආයෝජන කල අවධානම. අයවැයකරණය. අය වැයකරණය සඳහා වන ප්‍රවේශයන්, මුදල් අය වැය ලේඛනය සැකසීම. ආගනනය. බැඳුම්කර ආගනනය. කොටස් ආගනනය. ප්‍රාග්ධන ව්‍යුහය සහ දෝලනය.

ප්‍රාග්ධන ව්‍යුහය පිළිබඳ න්‍යායන්, ව්‍යාපාර හා මූල්‍ය අවදානම. ලාභාංශ ප්‍රතිපත්තිය. ලාභාංශ ප්‍රතිපත්තියක අරමුණ, ලාභාංශ ගෙවනු ලබන ආකාරයන්, ලාභාංශ පිළිබඳ න්‍යායන්. කාරක ප්‍රාග්ධන කළමනාකරණය, කාරක ප්‍රාග්ධන පිළිබඳ සංකල්පය, මෙහෙයුම් හා මුදල් චක්‍රය, ජංගම වත්කම් හා ජංගම වගකීම් කළමනාකරණය

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය**

දේශන සහ සම්මන්ත්‍රණ

**ඇගයීමේ ක්‍රමය**

පැවරුම් හා වර්ෂ අවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්**

1. Brigham, E.F. and Ehrhardt, M.C. (2011). *Financial Management: Theory and Practice.* 13th Ed; Cengage Learning, Mason.
2. Panady, I.M. (2004). *Financial Management.* 9th Ed; Vikas puublication Home Pvt.
3. Van Horne, J.C. and Wachowicz, J.M. (2008). *Fundamentals of Financial Management.* 13th Edi' Prentice Hsall. Edinburgh gate. Harlow.